ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2018 දෙසැම්බර් 14 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2018 නොවැම්බර්

### නිෂ්පාදන ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය විය

නොවැම්බර් මාසයෙහි දක්නට ලැබුණු මෙම අඩු වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම, නිමි ඇඳුම් නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම් සහ නිෂ්පාදනවල දක්නට ලැබුණු මන්දගාමීත්වය හේතු විය. කෙසේ වුවද, උත්සව සමයෙහි ඇතිවන ඉල්ලුම හේතුවෙන්, ආහාර සහ පාන අංශයෙහි නව ඇණවුම් සහ නිෂ්පාදනවල වර්ධනයක් දක්නට ලැබුණි. සේවා නියුක්තිය පෙර මාසයට සාපේක්ෂව නොවෙනස්ව පැවති අතර, ඒ සඳහා විශේෂයෙන්ම ගෘහ භාණ්ඩ නිෂ්පාදන අංශය සඳහා සේවකයන් සොයාගැනීමේ අපහසුතාවය ප්‍රධාන වශයෙන් හේතු විය.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **58.2** | **54.3** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 59.0 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 61.0 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.0 | 55.0 | = | සම වේගයකින් ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 61.0 | 57.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 54.0 | 52.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මේ අතර, නිමි ඇඳුම් අංශයෙහි නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු මන්දගාමීත්වය හේතුවෙන්, සමස්ත ගැනුම් තොගය පහළ යන ලදී. තවද, ආහාර සහ පාන අංශයෙහි නිෂ්පාදන කටයුතු වේගවත් කිරීම සඳහා ඇතිවූ ඉල්ලුම හේතුවෙන්, ඇණවුම් සැපයීමට සැපයුම්කරුවන් විසින් අඩු කාලයක් ගත කළ බැවින්, එම අංශයෙහි ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු වේගයකින් ඉහළ යන ලදී.


ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කළද, 2018 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**54.3**

**ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශක 3.9 ක අඩුවීමක්.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සැප්තැම්බර් මාසයේදී වාර්තා කළ 52.0 ක දර්ශක අගයම ඔක්තෝබර් මාසයේ දී වාර්තා කරන ලදී.

යුරෝපා කලාපය සහ එක්සත් ජනපදයෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කළ අතර, චීනය, ඉන්දියාව, රුසියාව සහ එක්සත් රාජධානිය යන රටවල වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2018 දෙසැම්බර් 12 වන දිනට)*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

## සේවා අංශයෙහි වර්ධනය පහළ යන ලදී

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය ආරම්භ කළ 2015 මැයි මාසයේ සිට වාර්තා වූ පහළම අගය වාර්තා කරමින්, 2018 නොවැම්බර් මාසයේ දී සේවා අංශය අඩු වේගයකින් වර්ධනය විය.

අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වාර්තා වූ පහළම දර්ශක අගය සේවා අංශයෙහි වර්ධනය පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, නව ව්‍යාපාර සහ සේවා නියුක්ති වර්ධනයෙහි ද සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණි. වර්තමාන දේශපාලනික වාතාවරණය සහ ඉදිරි ප්‍රතිපත්තිවල අවිනිශ්චිතතාව ප්‍රතිචාර දක්වන්නන්ගේ ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා සහ නව ව්‍යාපාරවල වර්ධනය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන ලදී. කෙසේ වුවද, ඉදිරි උත්සව සමය සහ සංචාරකයන් වැඩි වශයෙන් මෙරටට පැමිණෙන කාලය වීම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම සහ නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවල වර්ධනයක් වාර්තා වීම සතුටුදායක කරුණකි.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **55.5** | **52.6** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **<u>උප දර්ශක</u>** | | |
| නව ව්‍යාපාර | 58.2 | 53.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 57.1 | 57.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.4 | 52.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 43.1 | 44.6 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.6 | 55.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |


රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් ඉහළ යන ලදී. කෙසේ වුවද, මෑත කාලීනව සිදු වූ ඉන්ධන මිල පහළ යෑම, අපේක්ෂිත මට්ටමට වඩා අඩුවෙන් මිල ගණන් ඉහළ දැමීමට හේතු වූ බව ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කර තිබුණි. ප්‍රසාද දීමනා ගෙවීම් සහ වැටුප් වර්ධක හේතුවෙන් නොවැම්බර් මාසය තුල දී සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද ඉහළ ගියේය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**52.6**

**ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශක 2.9 ක අඩුවීමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ 53.4 හි සිට සිව් මසකින් වාර්තා වූ ඉහළම අගය වන 53.7 දක්වා ඉහල ගිය අතර පසුගිය මාස 112 තුළ වර්ධනයක් පෙන්නුම් කරයි. සමීක්ෂණය මගින් ආවරණය වන සියලු රටවල නොවැම්බර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දැකිය හැකි විය.

ජපානය, චීනය, එක්සත් රාජධානිය, ඉන්දියාව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව නොවැම්බර් මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2018 නොවැම්බර් 13 වන දිනට)*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.